සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | WBB/General/2022 | ඔබේ අංකය / உமது இல / Your No | |
| දිනය / திகதி / Date | 30 .09. 2022 | | |

සියලු ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**සුභසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම් පිණිස සුදුසු සඳහා සුදුසු තැනැත්තන්/ පවුල් හඳුනාගැනීම-2022**

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම**

විවිධ හේතූන් මත අයදුම්පත් ඉදිරිපත් කිරීමට අප්‍රමාදව කටයුතු නොකළ තැනැත්තන්, වැඩසටහනේ පාර්ශව ආයතන සහ ඒ සමඟ බැඳුණු විවිධ වෘත්තීය සමිති නියෝජිතයන් විසින් කරනු ලැබූ නියෝජනයන් ගැඹුරින් සලකා බැලූ සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය, සුභසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම් පිණිස සඳහා සුදුසු තැනැත්තන්/ පවුල් හඳුනාගැනීම-2022 වැඩසටහන යටතේ අයදුම්පත් ඉදිරිපත් කිරීමට දී තිබූ කාලසීමාව 2022 සැප්තැම්බර් 30 දින සිට තවත් සති දෙකකින් එනම් 2022 ඔක්තෝම්බර් 15 දක්වා දීර්ඝ කිරීමට තීරණය කර තිබේ.

මේ සම්බන්ධයෙන් ප්‍රසිද්ධ නිවේදනයක් 2022 සැප්තැම්බර් මස 30 වන දින "ලංකාදීප" පත්‍රයෙහි සහ "තිනකරණ" පුවත්පතේ පළ කිරීමට කටයුතු කර තිබේ. එම නිවේදනයේ සඳහන් පරිදි, අයදුම්පත නිර්දේශ කිරිමේ බලය ආර්ථික සංවර්ධන නිලධාරීන්ටද ලබා දී තිබෙන බව දැනුම් දෙමි. එම පුවත්පත් නිවේදනයේ පිටපතක් ඔබගේ දැන ගැනිම සඳහා මේ සමඟ අමුණා එවමි.

අයදුම්පත් කැඳවීමේ කාලය දීර්ඝ කිරීමද ඇතුළත් කරමින්, අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස නැවතවරක් ලංකාදීප හා තිනකරන් පුවත්පත් වල පලකළ මේ නිවේදනයේ අයදුම්පතට අදාල කොටසේ ආර්ථික සංවර්ධන නිලධාරින්ටද අයදුම්පත් නිර්දේශ කිරීමට ඇති හැකියාව සඳහන් කර තිබුණද, නිවේදනයේ දෙවන ඡේදයේ නිලධාරින්ගේ නිලනාමයන් අතර ආර්ථික සංවර්ධන නිලධාරීන් යන්න ඇතුළත් වීම ප්‍රමාද දෝෂයක් හේතු කොටගෙන අත්හැරී තිබේ. ඒ වෙනුවෙන් කණගාටුව පළ කරමි. කෙසේවූවද අයදුම්පත් නිර්දේශ කිරීමට ආර්ථික සංවර්ධන නිලධාරින්ටද ලබා දී ඇති බලයට එයින් අවහිරතාවයක් සිදු නොවන බවත්, ඒබව එම නිලධාරින්ට දැනුම් දෙන ලෙසත් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

බී.විජයරත්න
සභාපති/කොමසාරිස්

පිටපත - සියලු දිසාපති/දිස්ත්‍රික් ලේකම්කරුන් - කා.දැ.ග